# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1318/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 19/10/2023<br>පැය 0700 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**විරෝධතා පා ගමනක් විසුරුවා හැරීම. - පේරාදෙනිය පොලිස් වසම.**

2023.10.18 වන දින දහවල් කාලයේදී පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද විරෝධතා පා ගමනක් විශ්ව විද්‍යාල භූමියේ සිට ගැටඹේ වටරවුම හරහා මහනුවර ඔරලෝසු කණුව දක්වා ගමන් කිරීමට සූදානම් වන බවට පේරාදෙනිය පොලිස් ස්ථානයට තොරතුරු වාර්තාවී තිබුණි.

මෙම විරෝධතාවය හේතුවෙන් රජයේ කාර්යාල, පේරාදෙනිය ළමා රෝහල හා ශික්ෂණ රෝහල , උද්භිත උද්‍යානය, මහනුවර ශික්ෂණ රෝහල හා නගර ආශ්‍රිත පාසල් පිහිටා ඇති බැවින් හා මහජනතාවට දැඩි අපහසුතාවයට පත්වීමට ඉඩ ඇති බැවින් මේ සම්බන්ධයෙන් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර විරෝධතා පා ගමන වැළැක්වීම සඳහා පේරාදෙනිය පොලිසිය විසින් අධිකරණ නියෝගයක් ලබාගෙන තිබුණි.

එම වාරණ නියෝගය ද නොතකා විශ්ව විද්‍යාල සිසුන් 1500 ක පමණ පිරිසක් විරෝධතා පුවරු හා බැනර් ප්‍රදර්ශනය කරමින් ශබ්ද විකාශන යන්ත්‍ර ද උපයෝගී කරගනිමින් කොළඹ නුවර මාර්ගය අවහිර වන ලෙස විරෝධතා පා ගමන ක්‍රියාත්මක කරන ලදී. එම අවස්ථාවේදී විරෝධතාකරුවන් වෙත අධිකරණ නියෝගය දැනුම් දුන්න ද එය නොතකා ප්‍රකෝපකාරී ලෙස ඉදිරියට ගමන් කිරීම හේතුවෙන් පොලිසිය විසින් වායු කඳුළු භාවිතා කර විරෝධතාකරුවන් ගලහ හන්දිය දක්වා ආපසු හරවා යැවීමට ක්‍රියාකරන ලදී.

විරෝධතාවයේ යෙදුණු ශිෂ්‍යයන් විසින් එල්ල කරන ලද ගල් ප්‍රහාරයක් හේතුවෙන් පල්ලේකැලේ පොලිසියට අනුයුක්ත නිලධාරියෙක් තුවාල ලබා මහනුවර රෝහලට ඇතුළත් කර ඇති අතර, තවත් නිලධාරියෙකු අත තිබූ ආරක්ෂිත කුල්ලකට ද හානි සිදුව ඇත.

විරෝධතාවය පැවති කාලය තුල කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගය අවහිරව තිබූ බැවින් විකල්ප මාර්ග භාවිතා කරමින් ගමනාගමන කටයුතු පවත්වාගෙන යාමට පොලිසිය ක්‍රියා කරන ලදී. අනතුරුව විරෝධතාකරුවන් සවස 05.00 ට පමණ මාධ්‍ය වෙත අදහස් දක්වා විරෝධතාවය අවසන් කර විසිර යන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**